# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1988 අංක 4 දරන නිවාස දේපළ උපරිමය (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 මාර්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 4 දරන නිවාස දේපළ උපරිමය (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 15/87

**නිවාස දේපළ උපරිමය ඉවත් කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1988 අංක 4 දරන නිවාස දේපළ උපරිමය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**නිවාස දේපළ උපරිමය ඉවත් කිරීම.**

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පනතේ 2 වන වගන්තියේ හෝ වෙනත් යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ පටහැණිව කුමක් සඳහන්ව තිබුණ ද, පවුලක සාමාජිකයකු වන හෝ නොවන පුද්ගලයකු හෝ සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගල මණ්ඩලයක් හෝ සතුව තිබිය හැකි උපරිම නිවාස සංඛ්‍යාව සම්බන්ධයෙන්, 1987 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන් පසුව කිසිම සීමාවක් නොවිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

**ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ අයිතිය සීමා කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව තිබුණ ද නිවාසයක කුලී නිවැසියාට හෝ එම නිවාසයෙහි කුලී නිවැසි භාවයට 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 36 වන වගන්තිය යටතේ අනුප්‍රාප්ත වන කවර හෝ තැනැත්තකුට හෝ 1987 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන් පසුව, ඒ නිවාසය මිල දී ගැනීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ කවර හෝ විධිවිධානයක් යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත්තේ ය.

**ප්‍රධාන ප්‍රඥප්තිය අතීතයේ දී ක්‍රියාත්මක වීම කෙරෙහි මේ පනතේ විධිවිධාන බල නොපෑ යුතු බව.**

4. සැක දුරු කිරීම සඳහා මෙයින් මෙසේ ප්‍රකාශ කරනු ලැබේ. මේ පනතේ විධිවිධාන —

(අ) 1987 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම කෙරෙහි හෝ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යථා පරිදි කරන ලද නැතහොත් කිරීමට ඉඩ හරින ලද කිසිවක් කෙරෙහි හෝ බල නොපෑ යුතු අතර බලපා ඇති ලෙස නොසැලකිය යුතු ය.

(ආ) 1987 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ කරන ලද යම් වරදක් කෙරෙහි හෝ අත්කර ගන්නා ලද යම් අයිතිවාසිකමක් හෝ නිදහසක් කෙරෙහි හෝ ලබන ලද යම් දණ්ඩනයක් කෙරෙහි හෝ බල නොපෑ යුතු අතර බලපා ඇති ලෙස නොසැලකිය යුතු ය.

(ඇ) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ආරම්භ කරන ලදුව 1987 ජනවාරි මස 1 වන දිනට විනිශ්චයට භාජනව තිබෙන හෝ නොනිමිව පවත්නා යම් නඩුවක්, නීති කෘත්‍යයක් හෝ දෙයක් කෙරෙහි බල නොපෑ යුතු අතර බල පා ඇති ලෙස නොසැලකිය යුතු ය. තවද ඒ නඩුව, නීති කෘත්‍යය හෝ දෙය මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු නොලැබුවාක් සේ පවත්වාගෙන ගොස් නිම කළ හැකි ය.

2—ඒ 101421—7,285 (88/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.